18 JUL 2019



ද මැසිනොද් විදුහල කඳාන

De Mazenod College - Kandana

# සිංහල භාෂාව II

2019 ජුලි

පැය 3

13 ශ්‍රේණිය

I කොටසේ 1 ප්‍රශ්නයද, II කොටසේ 2 ප්‍රශ්නයද ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

Learning Resource Center R De Mazenod College Kandana

- පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න.

01) සඤ්ඤක අක්ෂර සේ සැලකෙන්නේ කවරක්ද ?
1. ය,ර,ල,ව
2. ක,ච,ට,ත,ප
3. ශ,ෂ,ස,ළ,ෆ
4. ඞ,ඤ,ණ,න,ම
5. ග,ජ,ඩ,ද,බ,

02) අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
1. අනුරාධපුරය, අලව්ව, අතුරුගිරිය, අඹේපුස්ස
2. කතරගම, කළුතර, කඩුවෙල, කඳුරුවෙල
3. මාතර, මාතලේ,මාලිගාතැන්න,මාවතගම
4. වවුනියාව, වඳුරඹ,වලපනේ, වඩමරච්චි
5. තණමල්විල, තවලම, තලවතුගොඩ, තලාව

( .......... )

03) සෑම පදයකම පාපිල්ල යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. නිසල, විසිතුරු, නිතර, මතක
2. දුදන, විරිත, වෙළඳ, බැදුම
3. කොටුව, තුහුරු, කුර,සෘතුව
4. නාදය,රුපු,දුලබ,කපටි
5. මාරුතය,සුවඳ, කුළුබඩු, උඩුවප්

( .......... )

04) උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. අනුවර්තනය, විවරණ, සංවාදය, ප්‍රතිපක්ෂ
2. අව්‍යාජ, නිර්දෝෂ, අස්වාභාවික, උපගුරු
3. අවගුණ, පරදේශ, අනුමාන, නොමනා
4. නිරුත්තර, පරෝපදේශය, උපකල්පනය, පරිහාසය
5. සංවර්ධනය, අභේද්‍ය, පරිවර්තනය, අසංවරය

( .......... )

05) පහත සඳහන් වාක්‍යවල අංකිත පදවලට නොගැළපෙන ව්‍යාකරණ අංගය දැක්වෙන වරණය තෝරන්න.
1. මාගේ <u>කාමරයෙහි</u> ඇඳන් දෙකක් ඇත. ( ආධාර කාරකය )
2. නංගී <u>කෙක්කෙන්</u> මල් කඩයි ( කරණ කාරකය )
3. අපි ගංවතුරෙන් <u>අනාථවූවන්ට</u> පිහිට වෙමු ( සම්ප්‍රදාන කාරකය )
4. ලේනා <u>වහලයෙන්</u> බිමට වැටුණි ( ආධාර කාරකය )
5. ආදි <u>ශිෂ්‍යයන්</u> විසින් විදුහල්පතිතුමා පිළිගැනිණින ( කර්තෘ කාරකය )

( .......... )

06) ගයනුකිත්ත, රකාරාංශය, රේඵය, හා යංශය සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. පෞද්ගලික, දුර්ජන, ක්‍රමික, විද්‍යාව
2. සෞන්දර්ය, ප්‍රබුද්ධ, කර්ණ, ඓක්‍යය
3. ප්‍රවර්ග, උගණ්රෝම, උපෞෂධ, ධාන්‍යය
4. ඖරසපුත්‍ර, මෛර්ය, අනෘ,අලෞකික, ප්‍රකට
5. විදෛශ්‍යය, ඖදාර්, අලෞකික, ප්‍රකට

( .......... )

07) ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
1. සියලු සිංහලයන් නිවැරදි සිංහලය උගනිත්වා
2. පයින් යන්නෝ පදික වේදිකාවෙන් යා යුතුය
3. විශාඛා සිටු දේවිය ශ්‍රද්ධාවන්ත උපාසිකාවක මෙන්ම යහපත් පතිනියක්ද වූවාය
4. සියලු ඥාති මිත්‍රාදීන් මේ සංවේගදායක නිවේදනය පිළිගනිත්වා
5. මා උසස් පෙළ විභාගය සමත් වෙතියි මගේ මව සිතයි

( .......... )

18 JUL 2019



08) තද්ධිත පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.
1. බුද්ධිමත්, අයෝමය, නෛතික, කළටි
2. සිටාණෝ, දියණියෝ, ගැමි, රූමත්
3. භෞතික, සෞන්දර්යය, ඒකීය, ඇහැටු
4. කැබිලිති, පාරම්පරික, දූහැමි, කාලීන
5. දානමය, දිරිමත්, ජනතා, ආරටු

( .......... )

09) ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයන් සහිත පද පේළිය තෝරන්න.
1. මෙන්, හෝ, කෙරෙන්, වනාහි
2. දිගටි, දියඹ, ගුණවත්, පහටි
3. ලියමන්, නැටිලි, ඉඳුම්, ගෙරවිලි
4. කැබිලිති, පාරම්පරික, දූහැමි, කාලීන
5. දානමය, දිරිමත්, ජනතා,අරටු

( .......... )

10) එකිනෙකාට අනුරූප වන සේ වචන යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. කළුවර මන්දිරය, ව්‍යාකරණ ලකුණු, සූර්ය මඬල, තාරකා පෙළ
2. ප්‍රදාන පුවත්, කර්කශ මඩුල්ල, අහස් ගැබ, ප්‍රීති වාක්‍යය
3. ප්‍රවෘත්ති පත්‍ර, ශ්‍රව්‍ය කාව්‍ය, ප්‍රකාශන අංශය, ශුභ මුහුර්තය
4. ධාරනිපාත වැස්ස, ප්‍රාචීන බස ඉගනුම, නභෝගැබ, පුලස්තිපුර රජදහන
5. දළදා මන්දිරය, සාරගර්භ දෙසුම. නෑ මිත්‍ර සමූහය, අභිනව මැදුර

( .......... )

11) එකමවරගයකට අයත් සන්ධි පද අන්තර්ගත වර්ණය තෝරන්න.
1. අතිනත, දකුණත, දිගත, සුරත
2. කොස්සැට, උරුමක්කාර, අල්ලස්, පොල්ලත්ත
3. ශාස්ත්‍රාලය, මුනීන්ද්‍ර, ක්‍රිස්තුත්පත්තිය, යථාර්ථ
4. ජාත්‍යාලය, විද්‍යාලය, හස්ත්‍යාලංකාර, කාව්‍යාවලිය
5. පුනරුක්, මෙයාකාර, කටුවල, දැවුරුදු

( .......... )

12) <u>සූරන්</u> සහ <u>සහසැස්</u> <u>නො</u>කර සිටියේ අහස් කුස හිස්... යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පස අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලටද ?
1. නිපාත, සමාස, විභක්ති
2. සමාස, නිපාත, විභක්ති
3. විභක්ති, සමාස, නිපාත
4. විභක්ති, නිපාත, සමාස
5. නිපාත, විභක්ති, සමාස

( .......... )

13) එකිනෙකට අනුරූප වන සේ වචන යෙදී ඇති වරණය තෝරන්න.
1. චන්ද්‍ර බිම්බය, මහ මර්ගය, ගගන ගැබ, විබත් ප්‍රත්‍යය
2. සඳබිඹුව, මහමඟ, ගුවන් ගර්භව. විභක්ති පස
3. නීල උපුල්. මහා මාර්ගය, චන්ද්‍ර බිම්බය, ගුවන් ගැබ
4. නීල උත්පල, මහ මඟ, චන්ද්‍ර බිම්බය, ගුවන් ගැබ
5. නිල් උපුල්, මහ මඟ, සඳ බිඹුව, ගුවන් ගැබ

( .......... )

1.14 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) අවලස්සන, අවපීඩන, අවකම්පන, අවමාන
(2) දුර්ජන, දුර්මන, දුර්නීති, දුර්විපාක
(3) අබිසෙස්, අබිමන්, අබිමුව, අබිදහම්
(4) විශිෂ්ට, විදේශ, විමධ්‍යගත, විමාන
(5) පිරිසුදු, පිරිපුන්, පිරිනිවන, පිරිසිඳ (..............)

1.15 ගනඳුර වසන විට ආලෝකයෙහි නෙත
සඳරැස් ගලන විට කෙරපී සෙවණ මත
මෙම පද්‍ය පාදවල **තද කළු අකුරින් මුද්‍රිත පදවල** ව්‍යාකරණ අංග පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?
(1) සන්ධි, විභක්ති, ක්‍රියා, සමාස
(2) සමාස, විභක්ති, සන්ධි, ක්‍රියා
(3) සන්ධි, විභක්ති, සමාස, ක්‍රියා
(4) සමාස, ක්‍රියා, සන්ධි, විභක්ති
(5) සන්ධි, සමාස, විභක්ති, ක්‍රියා (..............)

1.16 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක් ද?
(1) පුනරුක්ති, පුනරාගමනය, පුනරීක්ෂණය, පුනරුදය
(2) අඳනා, රඳනා, බඳනා, පවනා
(3) කියත, දමත, බඳින, අඳික
(4) නුවනත්, සවනත්, කොපුලත්, ගහණත්
(5) අතුර, මතුර, වපුර, විසුර (..............)

1.17 සමාසයක් නො වන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අනාදර, අව්‍යක්ත, අනවශ්‍ය, අශික්ෂිත
(2) මුහුදුදිය, ගම්වැසි, සරාසඳ, කැඹිලිතෙල්
(3) දසබල, විදුරත්, තිනෙත්, සහස්පත
(4) දුහුල්සළු, රතුපුල්, නිල්අහස, පිරිපත
(5) දෙව්බඹ, වතුපිටි, ගුරුසිසු, අඹදඹ (..............)

1.18 එක ම වර්ගයකට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) කම්මුල, පෙස්සම, ගෙත්තම, අල්ලස
(2) දැස, විරෝදාර, එකිනෙක, සූර්යෝදය
(3) නළඟන, තරිඳු, නුවනග, දිනිඳු
(4) මංපෙත්, ගම්පොළ, මිහින්තල, තඹුරු
(5) අත්‍යලංකාර, අන්වර්ථ, අභ්‍යුදය, නීත්‍යනුකූල (..............)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.
(1) මම දක්ෂ නාට්‍ය නිෂ්පාදකයකු වෙමි.
(2) තාපසවරුන් වනයේ පලාපල අනුභව කරත්තු
(3) ගුරුතුමා තම ශිෂ්‍යයන් යහමග යවති.
(4) තම ඥාති මිත්‍රාදීන් සමග මනාලිය විවාහ මංගලෝත්සවයට පැමිණියා ය.
(5) සෝමා දක්ෂ ගායිකාවක් ද නිළියක ද වන්නීය. (.............)

1.20 වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.
(1) මුළු පවුල ම ලබන සතියේ විදේශගත වන බව ඇය පැවසුවා ය.
(2) තාක්ෂණය මානවසංහතියේ ප්‍රගමනය සඳහා යොදාගැනීම වැදගත් ය.
(3) තුන්වන ලෝකයේ රට වල දරිද්‍රතාව තුරන් කරදීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රයත්නයයි.
(4) සිංහල කෙටිකතාවේ වර්ධනය උදෙසා බටහිර කෙටිකතාවේ ආභාසය ලැබුණුබව විචාරකයින් ගේ මතයයි.
(5) ලාංකික දූ දරුවන් ගේ වග කීම වන්නේ නිදහස් අධ්‍යාපනයේ නිසිපල ලබාගැනීමයි. (.............)

(ලකුණු 20 යි)

[4වන පිටුව බලන්න.

Learning Resource Centre
R
18 JUL 2019
De Mazenod College
Kandana

## II කොටස

මෙම කොටසේ 2, 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2\. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාව ජලයෙන් පෝෂිත රටකි. ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම හේතුවෙන් නිරිත දිග සහ ඊසාන දිග මෝසම් සුළඟ අපට ප්‍රධාන වශයෙන් වැසි ගෙන දෙන අතර කුඩා දිවයිනක් වීම නිසා සංවහන වැසි ද සුලභ ය. රට මැද පිහිටි මධ්‍යම කඳුකරය නිසා පතිත වර්ෂාව රට පුරා විහිදී ගංගා 103ක් ඔස්සේ මුහුදට ගලා යයි. බටහිර, නිරිත සහ දකුණු දිග ප්‍රදේශය ප්‍රබල නිරිත දිග මෝසම් සුළං මුහුණතේ පිහිටීමෙන් ජලය සුලභ ව ලැබේ. එහෙත් ඊසාන දිග මෝසම් සුළඟ විශාල ගොඩබිම් කලාපයක් හරහා හමා එන බැවින් ජලවාෂ්ප අඩු නිසා එමගින් ජනිත වර්ෂාව අඩු ය. එබැවින් ඊසාන දිග මෝසම් මුහුණතේ පවතින කලාපය රටේ වියළි කලාපය බවට පත් ව ඇත. එනමුදු අනුරපුර පොළොන්නරු රාජධානි පැවැති කාලයේ දී කෘෂිකර්මාන්තය අග්‍රස්ථානයක වැජඹුණු අතර අපරට පෙරදිග ධාන්‍යාගාරය නමින් ද හැඳින්විය. එදවස අහසින් පතිත ජලය ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩක් නො වීම එයට හේතුව විය. වැව් බැඳි රජරට සහ රුහුණේ පැවැති වාපි සංස්කෘතිය ශ්‍රී ලංකාවට ආවේණික ජල කළමනාකරණයයි. එය ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාව රැගෙන ගියේ ය. තෙත් කලාපයට ලැබුණු අධික වර්ෂාව තම ජීවනෝපාය සඳහා නොගැළපුණු බැවින් වියළි කලාපයේ වසන්නට අපේ ආදිතමයෝ උනන්දු වූහ. එහෙත් ඒ සඳහා ද ප්‍රමාණවත් වර්ෂාවක් ලැබුණේ නැත. එබැවින් ලද වර්ෂාවේ ජලය එක්රැස් කර ප්‍රයෝජනයට ගැනීමට ආදී වැසියා උත්සුක වූයේ ය. වාපි සංස්කෘතිය එමගින් අප ලත් දායාදයකි.

(i) ශ්‍රී ලංකාවට වැසි සුලබ වීමට බලපාන හේතු ලෙස ඉදිරිපත් කළ හැකි කරුණු මොනවා ද?
(ii) ආදිතමයන් තෙත් කලාපය බැහැර කොට වියළි කලාපයේ වාසය කරන්නට රුචියක් දැක්වූයේ ඇයි?
(iii) වාපි සංස්කෘතිය අප රටට දායාද වූයේ කෙසේ ද?
(iv) ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් උදාකර ගත්තේ කෙසේ ද?
(v) ඊසාන දිග මෝසම් මුහුණතේ පවතින ප්‍රදේශය රටේ වියළි කලාපය බවට පත් වූයේ ඇයි?

(ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

පර්යේෂකයන්ගේ නිගමනවලට හා විද්‍යමාන භාෂා වාර්තා සාක්ෂිවලට අනුව සිංහල භාෂාව පැරණි ඉන්දු ආර්ය භාෂා සම්ප්‍රදායෙන් තත්භව වූවක් ලෙස පිළිගැනේ. සිංහලය හා ඉන්දු ආර්ය භාෂා අතර පවත්නා ශබ්ද නීතිගත සාම්‍යතාව මෙයට ප්‍රධාන සාධකය ලෙස ඔවුහු සඳහන් කරති. එහෙත් සිංහල භාෂාව විකාශනයෙහි එක් එක් අවස්ථාවල දී විවිධ භාෂා සම්ප්‍රදායවල ආභාසය ලැබී තිබෙන බව දැක ගත හැකි ය. එසේ බලපෑ ප්‍රධාන භාෂාවක් ලෙස බොහෝ දෙනාගේ අවධානයට ලක් ව ඇත්තේ දෙමළ භාෂාව යි. දෙමළ භාෂාව අංග සිසිපයක් ඔස්සේ සිංහලයට බලපා තිබීම මෙයට හේතුව යි. හු විස්තෘතිය වශයෙන් සිංහල භාෂාවට වඩාත් ආසන්න ව දක්නට ලැබෙන්නේ ද්‍රවිඩ භාෂා ගණයට අයත් භාෂා ය. එසේ ම වර්තමානයේ පවතින ව්‍යවහාරවලට අමතර ව ක්‍රි. පූ. 3 වන සියවසේ සිට අද තෙක් ම අඛණ්ඩ ව පැවත එන සිංහල ලේඛන සම්ප්‍රදායට දෙමළ භාෂාවේ ආභාසය ලැබ තිබීම ද එක් සාධකයකි. මේ ඔස්සේ ද්‍රවිඩ ඝණ වචන රාශියක් සිංහලයට එකතු වී ඇත. මීට අමතර ව බොහෝ දෙනෙකු පෙන්වා දෙන ආකාරයට සිංහලයේ වාක්කෝෂය මතු නො ව ව්‍යාකරණය ද සැකසී ඇත්තේ දෙමළ ව්‍යාකරණය පදනම් කොටගෙන ය. ව්‍යාකරණ නීති රීති ම බලපා ඇති බව උගත් භාෂාඥයෝ පෙන්වා දෙති. ක්‍රි.පූ. යුගවල පටන් ම දෙමළ භාෂාව සිංහලය කෙරෙහි මගින් ද විවිධ පද යෙදුම් එකතු වෙමින් සිංහලයේ වාක්කෝෂය පෝෂණය වීමට දෙමළ භාෂාව බෙහෙවින් බලපාමින් පැවති බව පෙන්වා දෙන වාග්වේදීන් සඳහන් කරන්නේ එය දෙයාකාරයකින් සිදු වී ඇති බව යි. එනම්, ද්විභාෂක ලේඛකයන් මගින් හා පොදු ජනතාව හා දෙමළ භාෂකයන් අතර වූ සම්පර්කය මගින් ය.

(ලකුණු 15 යි)

[5වන පිටුව බලන්න.

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

1. ජනසමාජයක ප්‍රගමනය සඳහා උසස් දේශපාලන නායකත්වයක අවශ්‍යතාව
2. මානව සමාජයෙහි යහපත සඳහා සාහිත්‍යය යොදාගැනීම
3. බෝ නොවන රෝගවල සමාජ විපාක
4. අන්තවාදය වෙනුවට ආගමික සංහිඳියාව මතුකිරීමේ වැදගත්කම
5. රටක සංවර්ධනයෙහිලා කෘෂි ආර්ථිකය වැදගත්වන ආකාරය

(ලකුණු 25 යි)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
(i) චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට රසිකයෝ පැමිණෙති'යි මම සිතිමි.
(ii) ආපදාවෙන් විපතට පත් වූවෝ බේරා ගැනීමට කිසිවකු ඉදිරිපත් වී නැත.
(iii) සාමය උදෙසා ලෝක බලවත්තු එකාවන්ව නැඟී සිටිත්.
(iv) අමාත්‍ය මණ්ඩලයේ කෙනෙක් නව පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළහ.
(v) නීතිඥයන් නිවැරදිකරුවෝ මුදා හැර වැරදිකරුවන් නීතියේ රැහැනට කොටු කරගත යුතු ය.

(ලකුණු 05 යි)

(ආ) පහත සඳහන් වාක්‍යය කර්මකාරකයට හරවන්න.
(i) උසස් අධ්‍යාපන ආයතන නව වසර සඳහා සිසුන් බඳවා ගනියි.
(ii) දෙමවුපියෝ ගුරුවරුන් සඳහා උපහාර උළෙලක් සංවිධානය කරවන්නෝ ය.
(iii) දේශප්‍රේමීහු ස්වාර්ථය පතා රටෙහි නීතීන් උල්ලංඝනය නො කරත්.
(iv) රියැදුරෙක් මහ මග වැටී සිටි ගැබිනියක රෝහල් ගත කළේ ය.
(v) රටෙහි ජනතාව රකින්නෝ රණවිරුවෝ ය.

(ලකුණු 05 යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) පුවත්පත් (කලාවේදීහු/කලාවේදීන්) පැමිණියා හොත් අපි සාකච්ඡාව ආරම්භ කරමු.
(ii) විදග්ධ කවියෝ ආධුනික (කිවිඳියන්/කිවිඳියෝ) කැටුව කවි සම්මේලනයට සහභාගි වූහ.
(iii) මග දෙපස වූ තන් පැහැගත් (ප්‍රදීපයෝ/ප්‍රදීපයන්) නගරය අලංකාර කළහ.
(iv) සභාතොමෝ නව ව්‍යවස්ථාව ඒකච්ඡන්දයෙන් සම්මත (කළාය/කළහ)
(v) මෙම වසරේ ජනප්‍රිය ගායකයා (කවරෙක්/කවරෙකු) ද?

(ලකුණු 05 යි)

**5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. එහි අනුංගය ලියා දක්වන්න.**

**1. මා පාඩම් කළහොත් දෙමාපියෝ සිත් සතුටු කරගනිමින් නින්දට යති.**

**කළහොත් - ක්‍රියා , දෙමාපියෝ - විභක්ති , කරගනිමින් - ක්‍රියා**

**2. දූරබලනය අද්පානගත වීම නිසා ප්‍රබල ප්‍රහාරයකට මුහුණ දීමට නිලධාරියාට සිදු විය.**

**දූරබලනය - කෘදන්ත , නිසා - නිපාත , ප්‍රබල - සමාස**

**3. ඔබිනොබ රැස් වූ ජනතාව අසැබි වදනින් කෑගසද්දී අනුශූරතාව දිනූ කණ්ඩායම කලබල විය.**

**ඔබිනොබ - සන්ධි , කෑගසද්දී - ක්‍රියා , අනුශූරතාව - සමාස**

**4. කැහැටු බල්ලා ගැමි මිනිසුන්ගේ පාද සපාකෑම නිසා ගම්පුරා ජලභීතිකා බිය පැතිරිණි.**

**කැහැටු - තද්ධිත , මිනිසුන්ගේ - විභක්ති , ජලභීතිකා - සමාස**

**5. ගෝනියක දමා තිබූ සහල් දුටුවහොත් විදුහල්පතිතුමා මට දඬුවම් කරනු ඇත.**

**ගෝනියක - විභක්ති , දුටුවහොත් - ක්‍රියා , විදුහල්පතිතුමා - සන්ධි**

6. පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(නිවැරදි, හෙළ, සුරැකීම, දේශීය, සංරක්ෂණය, නිරවද්‍ය)

(අ) (i) ........................... වෙදකම වනාහි පුරාතනයේ පටන් පැවත එන්නකි.

(ii) රටක අනාගත සංවර්ධනය උදෙසා නායකයන් සතු .................. දැක්ම ඉවහල් වෙයි.

(iii) ...................... තාක්ෂණය ප්‍රබල ව ඉස්මතු වූ අංශයක් වනුයේ වාරි කර්මාන්තය යි.

(iv) පුරාවස්තු .................. සංචාරක ආකර්ෂණයට හේතුවකි.

(v) භාෂාවක් භාවිතයේ දී ...................... ව්‍යවහාරය අතිශයින් වැදගත් ය.

(vi) දරුවන් .................... සමාජ සේවා නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණයට ලක් විය යුතු ය.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අධ්‍යයන + අංශය (ii) ක්‍රිස්තු + උත්පත්තිය

(iii) එකින් + එක (iv) ජන්ම + උත්සවය

(v) බුද්ධි + ඉන්ද්‍රිය (vi) පුර + අඟහ

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **දරුවනි,** මං එන තුරු නිහඬ ව සිටින්නැයි **ගුරුතුමා** කීවේ ය.

(ii) "එන්න **දියේ** බැස මා හා - දෙන්න **මඩේ** අත මාලා"

(iii) පරිසරය අලංකාර කරන **සතුන්** පිළිබඳ ව අපි **දරුවන්ට** කියා දුන්නෙමු.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) විදේශ සංචාරකයා ලංකාවට පැමිණියේ ය සීගිරියට ගියේ ය. එය ක්‍රි ව පස් වන සියවසේ දී නිර්මාණය කළ බව අසා ඔහු පුදුම විය.

(ii) දරුවා අඬමින් ඉකි ගසමින් මවගේ උකුළෙහි දිගා වූයේ ය. ඈ දොයි දොයි දොයි යනුවෙන් ඔහු නැළවූවා ය.

(iii) ශිෂ්‍යයා ශිෂ්‍යාව 'මඟුල් කෑම' ග්‍රන්ථයේ 24 26 පිටුවලින් ඡේද උපුටා දක්වයි.

(ලකුණු 1/2 x 6 = 03 යි.)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මං අද විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඉල්ලුම් පත්‍රය යවනවා"යි නාලිකා පැවසුවා ය.

(ii) "ඩෙංගු රෝගය පැතිරීම වළක්වා ගැනීමට ඔබගේ නිවස සහ අවට පරිසරය පිරිසිදු ව තබා ගන්නැ"යි මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුම් දුන්නේ ය.

(iii) "අපි අපේ දරුවන්ට උගන්නන්නේ හරියට දුක් මහන්සි වෙලා"යි දෙමවුපියෝ ගුරුවරුන්ට පැවසූහ.

(ලකුණු 01 x 3 = 03 යි.)

07)

ඉ) ලෝක ධර්මී නාට්‍ය යථාවාද නාට්‍ය ලෙස ද ස්වාභාවික නාට්‍ය ලෙස ද හැඳින්වේ. **භරතමුනි** විසින් දක්වනු ලැබ ඇති **ආකාරයට** මෙහි නළුවන් අභිනය පාන්නේ **ස්වාභාවික** ලෙස ය. වඩාත් පැහැදිලි ව කිවහොත් නළුවාගේ කතා බහ ආංගික චලනය මුහුණෙන් පිළිබිඹු කරන හැඟීම් නාට්‍යයේ පසුතලය ආදිය සාමාන්‍ය ලෝක ස්වභාවයට සමාන වන්නේ නම් එවැනි නාට්‍යයක් හඳුන්වන්නට ලෝක ධර්මී යන්න වඩා නිවැරදි වේ. මෙවැනි නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂකයා කෙබඳු **තත්ත්වයකට** ලක්වන්නේ ද යන්න ද විමසිය යුතු ය. ලෝක ධර්මී නාට්‍ය නරඹමින් ප්‍රේක්ෂකයා **උපකල්පනය** කරන්නේ තමා ඉදිරියේ සිදුවන්නේ සත්‍ය සිදුවීමක් බවයි. නළු නිළි ඇඳුම් පැළඳුම්, වෙස් ගැන්වීම, කතා බහ, පසුතලය ආදිය සාමාන්‍ය ලෝකයට - එදිනෙදා ජීවිතයට සමීප ලෙස ගොඩ නගා තිබීම නිසා ප්‍රේක්ෂකයාට තමා නරඹන්නේ සත්‍යයක් - යථාර්ථයක් බව හැඟී යයි. ප්‍රේක්ෂකයා **සත්‍යයක්** යැයි සිතමින් නාට්‍යය නැරඹීමේ ස්වභාවය මහාචාර්ය සරච්චන්ද්‍ර හඳුන්වන්නේ තත්ත්වානුරූපී මායාව ලෙසයි.

1. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.
2. පිළිබිඹු, යථාර්ථයක්, එදිනෙදා යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.
3. ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
   1. නාසික්‍ය අක්ෂරයක් සහ මූර්ධජ අක්ෂරයක් (එකකින් පසුව අනික) යෙදී ඇති වචනයක්
   2. දන්තජ අක්ෂරයක් සහ ඕෂ්ඨජ අක්ෂරයක් යෙදුණු වචනයක්
   3. රේඵ අක්ෂරයක් සහ ඕෂ්ඨජ අක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වචනයක්
4. පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
   යථාර්ථයක් , ආංගික , තත්ත්වානුරූපී
5. පහත දක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.
   මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා , අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(ලකුණු 03 X 5 = 15 යි.)

08) පහත සඳහන් මාතෘකා වලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න

1. ස්වරසන්ධිය
2. මිශ්‍ර ක්‍රියා
3. උපසර්ග පද
4. විශේෂණසමාසය
5. කර්ම කාරක වාක්‍ය සහ කර්තෘ කාරක වාක්‍ය